13. දෙවතාපි මෙ එතමත්ථං ආරොචෙසි: "ආයස්මා භන්තෙ නන්දො භගවතො භාතා මාතුච්ඡාපුත්තො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතී"ති. යදෙව ඛො තෙ නන්ද අනුපාදාය ආසවෙහි චිත්තං විමුත්තං,[1] අථාහං මුත්තො එතස්මා පටිස්සවා"ති.

14. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

> "යස්ස නිත්තිණ්ණො පඞ්කො ච[2] මද්දිතො කාමකණ්ටකො,
> මොහක්ඛයං අනුප්පත්තො සුඛදුක්ඛෙසු න වෙධති ස භික්ඛූ"ති.[3]

3. 3.

## යසොජසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන යසොජපමුඛානි පඤ්චමත්තානි භික්ඛුසතානි සාවත්ථිං අනුප්පත්තානි හොන්ති, භගවන්තං දස්සනාය. තෙ ච ඛො[4] ආගන්තුකා භික්ඛූ නෙවාසිකෙහි භික්ඛූහි සද්ධිං පටිසම්මොදමානා සෙනාසනානි පඤ්ඤාපයමානා පත්තචීවරානි පටිසාමයමානා උච්චාසද්දා මහාසද්දා[5] අහෙසුං. අථ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: 'කෙ පනෙතෙ ආනන්ද, උච්චාසද්දාමහාසද්දා[5] කෙවට්ටා මඤ්ඤෙ මච්ඡවිලොපෙ'?ති.

"එතානි භන්තෙ යසොජපමුඛානි පඤ්චමත්තානි භික්ඛුසතානි සාවත්ථිං අනුප්පත්තානි භගවන්තං දස්සනාය. තෙ'තෙ ආගන්තුකා භික්ඛූ නෙවාසිකෙහි භික්ඛූහි සද්ධිං පටිසම්මොදමානා සෙනාසනානි පඤ්ඤාපයමානා පත්තචීවරානි පටිසාමයමානා උච්චාසද්දා මහාසද්දා"ති.

'තෙනහානන්ද මම වචනෙන තෙ භික්ඛූ ආමන්තෙහි "සත්ථා ආයස්මන්තෙ ආමන්තෙතී"ති. 'එවං භන්තෙ'ති ඛො ආයස්මා ආනන්දො භගවතො පටිස්සුත්වා යෙන තෙ භික්ඛූ තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තෙ භික්ඛූ එතදවොච: 'සත්ථා ආයස්මන්තෙ ආමන්තෙතී'ති.

'එවමාවුසො'ති ඛො තෙ භික්ඛූ ආයස්මතො ආනන්දස්ස පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නෙ ඛො තෙ භික්ඛූ භගවා එතදවොච: "කින්නු තුම්හෙ භික්ඛවෙ උච්චාසද්දා මහාසද්දා කෙවට්ටා මඤ්ඤෙ මච්ඡවිලොපෙ"ති.

1. විමුච්චි, - මජසං. 2. යස්ස තිණ්ණො කාමපඞ්කො, ධම්මපදට්ඨකථා 3. සුඛදුක්ඛෙසු න වෙධති, මජසං. 4. තෙ ධ. - සී. මු. 5. උච්චාසද්ද මහාසද්දා, මජසං.

13. දෙවියෙක් ද 'වහන්ස,...නන්දයෝ...පසක් කොට ලැබ වෙසෙති'යි මට මෙ කරුණ සැළ කෙළේ ය. නන්දයෙනි, යම් විටෙක ම තොප සිත උපාදාන රහිත ව ආස්‍රව කෙරෙන් මිදුණේ ද, එ විට මම් මේ ඇපයෙන් මිදුණෙමි"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

14. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ දැන එ වේලෙහි මේ උදන් ඇනූ සේක:

"යමකු විසින් දෘෂ්ටි නැමැති මඩවගුර හෝ සසර නැමැති මඩවගුර තරණය කරන ලදද, කෙලෙස් නැමැති කටුව මඩින ලද ද, යමෙක් මොහක්‍ෂයයට (රහත්පලයට) පැමිණියේ ද, ඒ මහණ සුවදුක් දෙක්හි නො සැලේ."

## 3. 3.

## යශොජ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර දෙව්රම්** නම් වූ **අනේපිඬුසිටුහු** අරම්හි වැඩ වසන සේක. එ සමයෙහි වනාහි **යසොජ** තෙරුන් ප්‍රමුඛ පන්සියක් පමණ මහණහු භාග්‍යවතුන් වහන්සේ දක්නට සැවැත්නුවරට පැමිණියාහු වෙති. ඒ ආගනතුක මහණහු ද නෙවාසික භික්ෂූන් හා පිළිසඳරින් සතුටු වෙමින් සෙනසුන් පණවන්නාහු, පාසිවුරු සුරැකි කොට තබන්නාහු, උස්හඬ මහ-හඬ ඇත්තෝ වූහ. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ අනඳ තෙරුන් අමතා, "ආනන්දයෙනි, තෙල කවුරු නම් මස්වොලෝහි[1] කෙවුළන් සේ උස් හඬ මහහඬ ඇත්තෝ දැ"යි අසා වදාළ සේක.

"වහන්ස, මේ යසොජ තෙරුන් ප්‍රමුඛ තෙල පන්සියක් පමණ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ දක්නා පිණිස සැවැතට පැමිණියාහු ය. ඒ ආගනතුක භික්ෂූහු නෙවාසික භික්ෂූන් හා පිළිසඳර විසින් සතුටු වෙමින් සෙනසුන් පණවන්නාහු, පාසිවුරු සුරැකි කොට තබන්නාහු, උස් හඬ මහහඬ ඇත්-තාහු"යී අනඳ තෙරණුවෝ වදාළහ.

"ආනන්දයෙනි, එසේ වී නම් මගේ වචනයෙන් ශාස්තෘ තෙම ආයුෂ්මතුන් අමතා ය යි ඔවුන් කැඳව"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. "එසේ ය, වහන්සැයි" ආයුෂමත් ආනන්ද ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී ඒ භික්ෂූන් වෙත එළඹ "ශාස්තෘන් වහන්සේ ආයුෂ්මතුන් කැඳවනසේකැ"යි ඒ භික්ෂූන්ට කී ය.

'එසේ ය, ඇවැත්නි'යි ඒ මහණහු අනඳ තෙරුනට පිළිවදන්දී භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ඒ භික්ෂූන් අමතා භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, කවර හෙයින් තෙපි මස්වොලොව්හි කෙවුළන් සේ උස් හඬ මහහඬ ඇතියව් දැ?"යි අසා වදාළ සේක.

---

1. මත්ස්‍ය විලොපයෙහි - මසුන් අල්ලන තැන. මසුන් ලබාගන්නට වුත් කලබල කරන්-නවුන් සංඝිඳුවන්නට කැකෝ ගැසීමෙහි.

2. එවං වුත්තෙ ආයස්මා යසොජො භගවන්තං එතදවොච: “ඉමානි භන්තෙ පඤ්චමත්තානි භික්ඛුසතානි සාවත්ථිං අනුප්පත්තානි භගවන්තං දස්සනාය. තෙ’මෙ ආගන්තුකා භික්ඛූ නෙවාසිකෙහි භික්ඛූහි සද්ධිං පටිසම්මොදමානා සෙනාසනානි පඤ්ඤපයමානා පත්තචීවරානි පටිසාමයමානා උච්චාසද්දා මහාසද්දා”[2]ති.

“ගච්ඡථ භික්ඛවෙ, වො පනාමෙමි. න වො මම සන්තිකෙ වත්ථබ්බ”න්ති.

“එවං භන්තෙ”ති ඛො තෙ භික්ඛූ භගවතො පටිස්සුත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා සෙනාසනං සංසාමෙත්වා පත්තචීවරමාදාය යෙන **වජ්ජී**, තෙන චාරිකං පක්කමිංසු. වජ්ජීසු අනුපුබ්බෙන චාරිකං චරමානා යෙන **වග්ගුමුදා** නදී, තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා වග්ගුමුදාය නදියා තීරෙ පණ්ණකුටියො කරිත්වා වස්සං උපගච්ඡිංසු.

3. අථ ඛො ආයස්මා යසොජො වස්සූපගතො භික්ඛූ ආමන්තෙසි: “භගවතා මයං ආවුසො පණාමිතා අත්ථකාමෙන හිතෙසිනා අනුකම්පකෙන අනුකම්පං උපාදාය. හන්ද මයං ආවුසො තථා විහාරං කප්පෙම, යථා නො විහරතං භගවා අත්තමනො අස්සා”ති.

‘එවමාවුසො’ති ඛො තෙ භික්ඛූ ආයස්මතො යසොජස්ස පච්චස්සොසුං. අථ ඛො තෙ භික්ඛූ වූපකට්ඨා අප්පමත්තා ආතාපිනො පහිතත්තා විහරන්තා තෙනෙවන්තරවස්සෙන සබ්බෙව තිස්සො විජ්ජා සච්ඡාකංසු.

4. අථ ඛො භගවා සාවත්ථියං යථාභිරන්තං විහරිත්වා යෙන **වෙසාලි** තෙන චාරිකං පක්කාමි. අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන වෙසාලි තදවසරි. තත්‍ර සුදං භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං. අථ ඛො භගවා වග්ගුමුදාතීරියානං භික්ඛූනං චෙතසා චෙතො පරිච්ච මනසි කරිත්වා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: “ආලොකජාතා විය මෙ ආනන්ද, එසා දිසා. ඔභාසජාතා විය මෙ ආනන්ද, එසා දිසා. යස්සං දිසායං වග්ගුමුදාතීරියා භික්ඛූ විහරන්ති. ගන්තුං අප්පටිකූලාසි මෙ මනසි කාතුං. පහිණෙය්‍යාසි ත්වං ආනන්ද වග්ගුමුදාතීරියානං භික්ඛූනං සන්තිකෙ දූතං, සත්ථා ආයස්මන්තෙ ආමන්තෙති. සත්ථා ආයස්මන්තානං දස්සනකාමො”ති.

‘එවං භන්තෙ’ති ඛො ආයස්මා ආනන්දො භගවතො පටිස්සුත්වා යෙන අඤ්ඤතරො භික්ඛු තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා තං භික්ඛුං එතදවොච: “එහි ත්වං ආවුසො. යෙන වග්ගුමුදාතීරියා භික්ඛූ, තෙනුපසඞ්කමෙය්‍යාසි[1] උපසඞ්කමිත්වා වග්ගුමුදාතීරියෙ භික්ඛූ එවං වදෙහි: සත්ථා ආයස්මන්තෙ ආමන්තෙති. සත්ථා ආයස්මන්තානං දස්සනකාමො”ති.

1. උපසඞ්කම, ම.

2. මෙසේ වදාළ කල්හි යසොජ තෙරණුවෝ “වහන්ස, මේ පන්සියක් පමණ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ දක්නා පිණිස සැවැතට පැමිණියාහු ය. ඒ මේ ආගන්තුක භික්ෂූහු නෙවාසික භික්ෂූන් හා පිළිසඳරින් සතුටු වෙමින් සෙනසුන් පණවන්නාහු පාසිවුරු සුරැකි කොට තබන්නාහු උස්හඬ මහහඬ ඇතියව් හ”යි සැළ කළහ.

“යව, මහණෙනි, තොප නෙරපමි. තොප මා වෙත නො විසිය යුතු” ය යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

‘එසේ ය වහන්සැ’යි කියා ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී හුනස්නෙන් නැගී භාග්‍යවතුන් වහන්සේ පැදකුණු කොට සෙනසුන් සුරැකි කොට තබා පාසිවුරු ගෙන වැදැරට බලා සැරි සරා වැඩියහ. වැදැරට පිළිවෙළින් සැරි සරන්නාහු වග්ගුමුදා නදිය කරා එළැඹි-යහ. එළැඹ වග්ගුමුදා නදිය තෙර පන්සල් කොට වස් එළැඹියහ.

3. ඉක්බිති යසොජ තෙරණුවෝ වස් එළැඹියෝ භික්ෂූන් බණවා “ඇවැත්නි, අපට වැඩ කැමැති හිත පතන අනුකම්පා කරන භාග්‍යවතුන් වහන්සේ විසින් අනුකම්පාව සඳහා අපි නෙරපන ලද්දමු. එ බැවින් අපි යම්සේ වසන අපට භාග්‍යවතුන් වහන්සේ සතුටු වන සේක් ද, එසේ විසීම කරමු”යි වදාළහ.

‘එසේ ය ඇවැත්නි’යි කියා ඒ මහණහු යසොජ තෙරුන්ට පිළිවදන් ඇස්වූහ. ඉක්බිත්තෙන් ඒ මහණහු විවිකත වූවාහු නොපමා වැ කෙලෙස් තවන වැර ඇති වැ නිවන් කරා මෙහෙයූ සිතැති ව වසන්නාහු ඒ වස් සමය ඇතුළත ම සියල්ලෝ ම ත්‍රිවිද්‍යා පසක් කළහ.

4. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සැවැත්හි රිසි තාක් කල් වැස විසල්පුර බලා සැරි සරා වැඩි සේක. පිළිවෙළින් සැරි සරන සේක් විසල්පුරට පැමිණ වදාළ සේක. භාග්‍යවතුන් වහන්සේ එහි විසල්පුර මහවෙනෙහි කූළාරහල් වෙහෙරෙහි වැඩ වසන සේක. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ වග්ගුමුදාතීර වැසි මහණුන්ගේ සිත් සිය සිතින් පිරිසිඳ මෙනෙහි කොට අනඳ තෙරුන් බණවා, “ආනන්‍දයෙනි, යම් දෙසෙක වග්ගුමුදාතීරවාසී මහණහු වෙසෙත් ද, එ දෙස මට පහළ වූ එළිය ඇත්තක් මෙනි. පහළ වූ ආලොකය ඇත්තක් මෙනි. යන්නට මෙනෙහි කරන්නට මට නොපිළිකුල් ය. (මනාප ය). ආනන්‍දයෙනි, තොප ‘ශාස්තෘ තෙම ආයුෂ්මතුන් කැඳවයි. ශාස්තෘ තෙම ආයුෂ්මතුන් දකිනු කැමැතිය’යි වග්ගුමුදාතීර වැසි මහණුන් වෙතට දූතයකු යවන්නෙ”යි වදාළ සේක.

‘එසේ ය වහන්සැ’යි කියා අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී, එක්තරා මහණකු කරා එළැඹියහ. එළැඹ ඒ මහණහු බණවා “ඇවැත්නි, තෙපි මෙහි එව. වග්ගුමුදාතීරවාසී මහණුන් වෙතට යව. එළැඹ වග්ගුමුදාතීරවාසී මහණුනට “ඇවැත්නි, ශාස්තෘ තෙම ආයුෂ්මතුන් කැඳවයි. ශාස්තෘ තෙම ආයුෂ්මතුන්ගේ දක්ම කැමැත්තේ ය”යි මෙසේ කියන්නැ.

“එවමාවුසො”ති ඛො සො භික්ඛු ආයස්මතො ආනන්දස්ස පටිස්සුත්වා සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පාසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය. එවමෙව මහාවනෙ කූටාගාරසාලායං අන්තරහිතො වග්ගුමුදාය නදියා තීරෙ තෙසං භික්ඛූනං පුරතො පාතුරහොසි. අථ ඛො සො භික්ඛු වග්ගුමුදාතීරියෙ භික්ඛූ එතදවොච: “සත්ථා ආයස්මන්තෙ ආමන්තෙති, සත්ථා ආයස්මන්තානං දස්සනකාමො”ති.

‘එවමාවුසො’ති ඛො තෙ භික්ඛූ තස්ස භික්ඛුනො පටිස්සුත්වා සෙනාසනං සංසාමෙත්වා පත්තචීවරමාදාය සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය. එවමෙව වග්ගුමුදාය නදියා තීරෙ අන්තරහිතා මහාවනෙ කූටාගාරසාලායං භගවතො සම්මුඛෙ පාතුරහෙසුං.

5. තෙන ඛො පන සමයෙන භගවා ආනෙඤ්ජෙන සමාධිනා නිසින්නො හොති. අථ ඛො තෙසං භික්ඛූනං එතදහොසි “කතමෙන නු ඛො භගවා විහාරෙන එතරහි විහරතී”ති. අථ ඛො තෙසං භික්ඛූනං එතදහොසි: “ආනෙඤ්ජෙන ඛො භගවා විහාරෙන එතරහි විහරතී”ති. සබ්බෙව ආනෙඤ්ජෙන සමාධිනා නිසීදිංසු

6. අථ ඛො ආයස්මා ආනන්දො අභික්කන්තාය රත්තියා නික්ඛන්තෙ පඨමෙ යාමෙ උට්ඨායාසනා එකංසං චීවරං කරිත්වා යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා භගවන්තං එතදවොච: “අභික්කන්තා භන්තෙ රත්ති. නික්ඛන්තො පඨමො යාමො. චිරනිසින්නා ආගන්තුකා භික්ඛූ. පටිසම්මොදතු භන්තෙ භගවා ආගන්තුකෙහි භික්ඛූහි”ති.

7. එවං වුත්තෙ භගවා තුණ්හී අහොසි. දුතියම්පි ඛො ආයස්මා ආනන්දො අභික්කන්තාය රත්තියා නික්ඛන්තෙ මජ්ඣිමෙ යාමෙ උට්ඨායාසනා එකංසං චීවරං කරිත්වා යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා භගවන්තං එතදවොච: “අභික්කන්තා භන්තෙ රත්ති. නික්ඛන්තො මජ්ඣිමො යාමො. චිරනිසින්නා ආගන්තුකා භික්ඛූ, පටිසම්මොදතු භන්තෙ භගවා ආගන්තුකෙහි භික්ඛූහී”ති දුතියම්පි ඛො භගවා තුණ්හී අහොසි. තතියම්පි ඛො ආයස්මා ආනන්දො අභික්කන්තාය රත්තියා නික්ඛන්තෙ පච්ඡිමෙ යාමෙ උද්ධතෙ අරුණෙ නන්දිමුඛියා රත්තියා උට්ඨායාසනා එකංසං චීවරං කරිත්වා යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා භගවන්තං එතදවොච: “අභික්කන්තා භන්තෙ රත්ති. නික්ඛන්තො පච්ඡිමො යාමො. උද්ධතො අරුණො. නන්දිමුඛී රත්ති. චිරනිසින්නා ආගන්තුකා භික්ඛූ, පටිසම්මොදතු භන්තෙ භගවා ආගන්තුකෙහි භික්ඛූහී”ති.

අථ ඛො භගවා තම්හා සමාධිම්හා වුට්ඨහිත්වා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: “සචෙ ඛො ත්වං ආනන්ද ජානෙය්‍යාසි, එත්තකම්පි තෙ නප්පටිභාසෙය්‍ය. අහඤ්ච ආනන්ද, ඉමානි ච පඤ්ච භික්ඛුසතානි සබ්බෙව ආනෙඤ්ජසමාධිනා නිසීදිම්හා”ති.

'එසේ ය, ඇවැත්නි'යි කියා ඒ මහණ තෙම ආයුෂ්මත් අනඳ තෙරුන්ට පිළිවදන් දී ශක්තිමත් පුරුෂයෙක් හැකුළු අත දිග හරින්නා සේ ම දිග හළ අත හකුළන්නා සේ ම මහවෙනෙහි කූටාගාරශාලා විහාරයෙහි අතුරුදන් ව වග්ගුමුදානදිය තෙර ඒ මහණුන් ඉදිරියේ පහළ විය. ඉක්බිත්තෙන් ඒ මහණ වග්ගුමුදාතීරවාසී මහණුනට "ශාස්තෘන් වහන්සේ ආයුෂ්මතුන් කැඳවන සේක. ශාස්තෘන් වහන්සේ ආයුෂ්මතුන් දක්නා කැමැති සේකැ"යි මෙ බස් පැවැසී ය.

'එසේ ය, ඇවැත්නි'යි කියා ඒ මහණහු යට කී මහණහට පිළිවදන් අස්වා සෙනසුන් සුරකි කොට තබා පාසිවුරු ගෙන බලවත් පුරුෂයකු හැකුළු අතක් දික් කරන සේ දික් කළ අත හකුළන්නා සේ ම වග්ගුමුදා-තීරයෙන් අතුරුදහන් වූවාහු මහවෙනෙහි කූටාරහල්වෙහෙරෙහි භාග්‍යවතුන් වහන්සේ හමුයෙහි පහළ වූහ.

5. එ සමයෙහි භාග්‍යවතුන් වහන්සේ ආනෙඤ්ජ සමාධියෙන් (චතුර්ථ-ධ්‍යානය පාදක කොටැති රහත්පල සමවතින්) වැඩ හුන් සේක් වෙති. එකල්හි ඒ මහණුනට භාග්‍යවතුන් වහන්සේ කවර නම් විහරණයෙකින් දැන් වසන සේක් දැ?'යි මේ සිත විය. ඉක්බිති ඒ භික්ෂූන්ට භාග්‍යවතුන් වහන්සේ ආනෙඤ්ජසමාධියෙන් දැන් වසන සේකැ'යි මේ සිත විය. ඉක්බිති සියල්ලෝ ම ආනෙඤ්ජසමාධියෙන් හුන්හ.

6. ඉක්බිති අනඳ තෙරණුවෝ රැය ගෙවුණු කල්හි පළමු යම ගත වුණු කල්හි භාග්‍යවතුන් වහන්සේ දිශාවට දෙහොත් මුඳුන් තබා වැඳ සිවුර එකස් කොට පෙරෙවැ භාග්‍යවතුන් වහන්සේ දසාවට ඇදිලි බැඳ ගෙන "වහන්ස, රැය බොහෝ ඉක්ම ගියේ ය. පළමු යාමය නික්මුණේ ය. ආගන්තුක භික්ෂූහු බොහෝ වේලා හුන්නාහු වෙති. වහන්ස, ආගන්තුක භික්ෂූන් හා පිළිසඳරින් තුස්නකතා කෙරේවා"යි සැළ කළහ.

7. මෙසේ සැළ කළ කල්හි භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණීම්භූත වූ සේක. දෙවෙනි වර ද අනඳ තෙරණුවෝ රෑ බොහෝ වේලා ගත වූ කල්හි මැද යම නික්මුණු කල්හි හුනස්නෙන් නැගී සිට සිවුර එකස් කොට පෙරෙවැ භාග්‍ය-වතුන් වහන්සේ දසාවට දෙහොත් මුඳුන් තබා වැඳ භාග්‍යවතුන් වහන්සේට "වහන්ස, රැය බොහෝ ඉක්මැ ගියේ ය. මැදුම් යම නික්මුණේ ය. ආගන්තුක භික්ෂූහු හුන් බොහෝ වේලා ඇත්තාහ. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ආගන්තුක භික්ෂූන් හා පිළිසඳර කතා කරන සේක්වා"යි සැළ කළහ. දෙවෙනි වර ද භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණීම්භූත වූ සේක. තෙවෙනි වර ද අනඳ තෙරණුවෝ රෑ බොහෝ ඉක්මැ ගිය කල්හි පැසිම් යම්හි අරුණු නැගි කල්හි රෑ පාන් වන කල්හි හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් දසාවට දෙහොත් මුඳුනැ තබා වැඳ "වහන්ස, රෑ බොහෝ ඉක්මිණ. පැසිම් යම ගෙවිණ. අරුණු නැගිණ. රෑ පහන් වෙයි. ආගන්තුක භික්ෂූහු හුන් බොහෝ කල් ඇත්තෝ ය. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ආගන්තුක භික්ෂූන් හා පිළිසඳර කතා කරන සේක්වා"යි සැළ කළහ.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ සමාධියෙන් නැගී සිට අනඳ තෙරුන් බණවා "ආනන්දයෙනි, ඉදින් තෙපි දන්නහු නම්, මෙ පමණකුදු තොපට නො වැටැහෙන්නේ ය (නො සිතෙන්නේ ය). ආනන්දයෙනි, මමත් මේ පන්සියක් භික්ෂූහුත් යන අපි හැමදෙනමෝ ආනෙඤ්ජසමාධියෙන් හුන්නම්හ"යි වදාළ සේක.

8. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

"යස්ස ජිතො කාමකණ්ටකො
අක්කොසො ච වධො ච බන්ධනඤ්ච,
පබ්බතො විය සො ඨිතො අනෙජො
සුඛදුක්ඛෙසු න වෙධති ස භික්ඛූ"ති.

## 3. 4.

## සාරිපුත්තසුත්තං.

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ** **අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා **සාරිපුත්තො** භගවතො අවිදූරෙ නිසින්නො හොති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා. අද්දසා ඛො භගවා ආයස්මන්තං සාරිපුත්තං අවිදූරෙ නිසින්නං පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා.

2. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

"යථාපි පබ්බතො සෙලො අචලො සුප්පතිට්ඨිතො,
එවං මොහක්ඛයා භික්ඛු පබ්බතො'ව න වෙධතී"ති.

## 3. 5.

## කොලිතසුත්තං.

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ** **අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා **මහාමොග්ගල්ලානො** භගවතො අවිදූරෙ නිසින්නො හොති, පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය කායගතාය සතියා අජ්ඣත්තං සූපට්ඨිතාය. අද්දසා ඛො භගවා ආයස්මන්තං මහාමොග්ගල්ලානං අවිදූරෙ නිසින්නං පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය කායගතාය සතියා අජ්ඣත්තං සූපට්ඨිතාය.

2. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

"සති කායගතා උපට්ඨිතා ඡසු ඵස්සායතනෙසු සංවුතො,
සතතං භික්ඛු සමාහිතො ජඤ්ඤා නිබ්බානමත්තනො"ති.

8. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය දැන (සලකා) එ වේලෙහි මේ උදන් ඇනූ සේක:

"යමක්හු විසින් කෙලෙශකාම නැමැති කටුව දිනන ලද්දේ (ප්‍රහත කරන ලද්දේ) වේ ද, ආක්‍රොශ ද වධ ද බන්ධන ද දිනන ලද්දේ වේ ද, ඒ මහණ පර්වතයක් මෙන් අචල ව සිටියේ සුව දුක්හි කම්පිත නො වේ."

## 3. 4.

## ශාරිපුත්‍ර සූත්‍රය.

1 මා විසින් මෙසේ අසන ලදි: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර දෙව්රම්** නම් වූ **අනේපිඬු** සිටුහුගේ අරම්හි වැඩ වසන සේක. එ සමයෙහි වනාහි **සැරියුත්** තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට නොදුරෙහි පලක් බැඳ උඩුකය සෘජු කොට පිහිටුවා සමාධි අරමුණට සිහිය යොමු කොට එළවා තබා වැඩ හුන්නාහු වෙති. භාග්‍යවතුන් වහන්සේ පලක් බැඳ කය සෘජු කොට තබා අරමුණට අභිමුඛ කොට සිහිය එළවා නොදුරෙහි වැඩ හුන් සැරියුත් තෙරුන් දුටු සේක.

2. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ කරුණ දැන එ වේලෙහි මේ උදන් ඇනූ සේක:

"යම්සේ ගල්පව්වෙක් අචල වැ මොනොවට පිහිටියේ ද, එසේ ම මහණ තෙම මොහය ක්ෂීණ වීමෙන් පව්වක් මෙන් නො සැලේ".

## 3. 5.

## කොලිත සූත්‍රය

1: මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයේ **දෙව්රම්** නම් වූ **අනේපිඬු** සිටුහුගේ අරම්හි වැඩ වසන සේක. එසමයෙහි **මහමුගලන්** තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට නොදුරෙහි පලක් බැඳ, උඩුකය සෘජු කොට පිහිටුවා සිය සතන්හි මොනොවට එළඹැ සිටි කය අරමුණු කොට පැවැති සිහියෙන් යුතු වැ හුන්නාහු වෙති. භාග්‍යවතුන් වහන්සේ පලක් බැඳ කය සෘජු කොට පිහිටුවා සිය සතන්හි මොනොවට එළඹැ සිටි කය අරමුණු කොට පැවැති සිහියෙන් යුතු වැ නොදුරෙහි වැඩැ හුන් මහමුගලන් තෙරුන් දුටු සේක.

2. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ දැන ඒ වේලෙහි මේ උදන් ඇනූ සේක

"යමක්හුගේ කය අරමුණු කොට ඇති සිහිය එළඹැ සිටියේ වේ ද, යමෙක් සපර්ශයට කාරණ වූ සදෙරෙහි සංවෘත වූයේ ද, (සදෙරෙහි ඉන්ද්‍රිය සංවරයෙන් සංවෘත ද) එසේ වූ නිරතුරු විපස්සනා සමාධියෙන් සමාහිත වූ මහණ තෙම තමාගේ (පසක් කිරීමෙන්) නිවන දන්නේ ය."